තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන
මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ
මහා නායක ස්ථවිර,
මල්වතු මහා විහාරය, මහනුවර, ශ්‍රී ලංකාව

වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණාරතනාභිධාන
මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ
මහා නායක ස්ථවිර,
අස්ගිරි මහා විහාරය, මහනුවර, ශ්‍රී ලංකාව

2025 අප්‍රේල් 27

## සමස්ත ලෝකවාසී මහජනතාව වෙත ආශිර්වාදාත්මකව ශ්‍රී දළදා වන්දනාව සාර්ථකව නිම කළ වගයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපතිතුමන් විසින් සිදුකරන ලද ඉල්ලීම හා ආරාධනාව අනුව වසර 16 පසුව දිවමන් බුදුරජාණන් වහන්සේ හා සමාන වූ සුවාසූ දහසක් ධර්මස්කන්ධයේ ස්පර්ශය ලද වාම ශ්‍රී දංෂ්ට්‍රා ධාතූන් වහන්සේ දැක වන්දනාමාන කර ගැනීමේ සුදුර්ලභ අවස්ථාව චිරාගත චාරිත්‍රානුකූලව සමස්ත ලෝකවාසී මහජනතාව වෙත ලබා දීමට මෙම වර්ෂයේ අප්‍රේල් මස 18 දින සිට 27 දින දක්වා පුරා දින දහයක් උදා කර දීමට කටයුතු කළෙමු. මෙම කාල පරාසය තුළ දේශීය හා විදේශීය වශයෙන් ලක්ෂ සංඛ්‍යාත පිරිසක් ස්වකීය ශ්‍රද්ධාධ්‍යාශයන් වඩා වර්ධනය කර ගනිමින් බුද්ධාලම්භන ප්‍රීතියෙන් යුතුව දළදා වහන්සේ සියැසින් දැක වන්දනාමාන කර ගැනීමට භාග්‍යවන්ත වූ බව මල්වතු - අස්ගිරි උභය මහාවිහාර හා ශ්‍රී දළදා මාළිගාව වෙනුවෙන් ඉමහත් සංතෝෂයෙන් නිවේදනය කරමු.

ශ්‍රී ලංකා ඉතිහාසය තුළ මෙතෙක් සිදු වූ විශාලතම මහජන ඒකරාශී වීම සනිටුහන් කළ මෙම උදාර පුණ්‍යෝත්සවයේ සාර්ථකත්වය උදෙසා දායකත්වය අනුග්‍රහය ලබාදුන් පාර්ශවයන් විශාල ප්‍රමාණයකි. විශේෂයෙන්ම ශ්‍රී දළදා වන්දනාව ආරම්භ කිරීමට ආරාධනා කළ අවස්ථාවේ පටන් පෙර රජ දවස සිට පැවති චාරිත්‍රානුකූලව මේ සම්බන්ධ සියලු කටයුතු පෞද්ගලිකවම සොයා බලමින් දළදා වන්දනාව උදෙසා සපැමිණි ලක්ෂ සංඛ්‍යාත මහජනතාව වෙනුවෙන් අවශ්‍ය කරන සියලු පහසුකම් සලසා දෙමින් රාජ්‍ය යාන්ත්‍රණයේ සහයෝගය හා දායකත්වය අවශ්‍ය සියලුම කටයුතු ඉමහත් ඕනෑකමින් සිදුකරදුන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපතිතුමන් ප්‍රමුඛ රජයට අපගේ පුණ්‍යානුමෝදනාව හා ස්තුතිය පිරිනමමු. එසේම මෙම සත්කාර්යය සම්බන්ධයෙන් ඉමහත් උනන්දුවෙන් කටයුතු කළ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමන්, එම අමාත්‍යාංශ ලේකම්තුමන් මෙන්ම බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්තුමන් ඇතුළු බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ සහයෝගය ද මෙහිලා පුණ්‍යානුමෝදනා පූර්වකව හා ස්තුති පූර්වකව සිහිපත් කර සිටිමු.

තව ද මෙම උදාර පුණ්‍යෝත්සවයේ සියලු කටයුතු සංවිධානය කිරීමේ දී හා පිරිස් හැසිරවීමේ දී අවශ්‍ය ආරක්ෂාව ලබාදෙමින් දිවා රාත්‍රී නොනකා සේවය සලසා දුන් ශ්‍රී ලංකා පොලීසිය, ශ්‍රී ලංකා යුධ හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාවට මෙන්ම ගමන් මළු පර්යන්ත කළමනාකරණය සඳහා සහයෝගය ලබාදුන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවටත් ලක්ෂ සංඛ්‍යාත මහජනතාව වෙත අවශ්‍යය සියලුම සනීපාරක්ෂක පහසුකම් සලසා දෙමින් මෙම උදාර සත්කාර්යයෙහි සාර්ථකත්වය උදෙසා සියලු සහයෝගයන් ලබා දුන් මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමන් ඇතුළු කාර්ය මණ්ඩලය, දිසපතිතුමන් ඇතුළු කාර්ය මණ්ඩලය, මහනුවර නාගරික කොමසාරිස්තුමිය ඇතුළු මහනුවර මහනගර සභාවේ සමස්ත කාර්ය මණ්ඩලයටත් අපගේ පුණ්‍යානුමෝදනාව හා ස්තුතිය පළ කර සිටිමු. තව ද ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය, මහනුවර මහරෝහල් කාර්යමණ්ඩලය ඇතුළු සෞඛ්‍ය පහසුකම් ලබාදුන් සියලුම ස්වේච්ඡා සංවිධාන, මාධ්‍ය ආවරණය ලබාදුන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ඇතුළු සියලු මාධ්‍ය ආයතන වෙතත් සියලු රාජ්‍ය හා ස්වේච්ඡා සංවිධාන වෙතත් අපගේ පුණ්‍යානුමෝදනාව හා ස්තුතිය පළ කර සිටිමු.

තව ද ශ්‍රී දළදා දැක්ම සිදු කළ මෙම කාල වකවානුව පුරාවටම පැමිණෙන ලක්‍ෂ සංඛ්‍යාත මහජනතාව වෙත අහාරපාන ලබාදුන් සියලුම දානපතීන් වෙත ද අවශ්‍ය සනීපාරක්‍ෂක පහසුකම් ලබාදුන් සියලු සංවිධාන වෙත ද අපගේ පුණ්‍යානුමෝදනාව හා ස්තුතිය පළ කරන අතරම පැමිණි අතිවිශාල ජනකාය වෙත දිවාරාත්‍රී නොබලා පහසුකම් ලබා දීමට කටයුතු කළ මහනුවර දෙමළ, ඉස්ලාම්, කතෝලික සියලු මහජනතාව වෙත ද ඉමහත් පරිත්‍යාගයෙන් පැමිණි ලක්‍ෂ සංඛ්‍යාත මහජනතාව වෙත පහසුකම් සැලසීමට කටයුතු කළ මහනුවර ජනතාව ද පුණ්‍යානුමෝදනා හා ස්තුති පූර්වකව සිහිපත් කර සිටිමු.

මාස කිහිපයක් පුරාවට මෙම සත්කාර්යයේ සාර්ථකත්වය උදෙසා දිවා රාත්‍රී නොබලා ස්වකීය දායකත්වය දෙමින් කටයුතු කළ ශ්‍රී දළදා මාළිගාවේ සේවා කාර්ය මණ්ඩලය ඇතුළු සමස්ත කර්ය මණ්ඩලය ද වෙත ද පුණ්‍යානුමෝදනාව පළ කරන අතරම චිරාගත චාරිත්‍රානුකූලව දළදා වන්දනාව උදෙසා ස්වකීය රාජකාරීමය දායකත්වය මෙනම නන් අයුරින් සහයෝගය දැක් වූ මහනුවර සිවු මහාදේවාලයන්හි බස්නායක නිලමේවරුන්ට මෙන්ම පිරිසර දේවාල බස්නායක නිලමේවරුන් ද පුණ්‍යානුමෝදනා හා ස්තුති පූර්වකව සිහිපත් කර සිටිමු.

ජීවමාන බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් සිදුකරන උදාරතර පූජෝපහාරයක් යන අරමුණ පෙරදැරිව මෑත ඉතිහාසය තුළ සිදුකරන ලද විශාලතම බුද්ධ වන්දනාව වෙනුවෙන් නන් අයුරින් සහයෝගය දැක් වූ ගරු ජනාධිපතිතුමන් ඇතුළු දේශීය විදේශීය සියලු දෙනා වෙත දළදා සමිඳුන්ගේ ආශීර්වාදයෙන් මෙම රැස්කර ගත් උදාර කුසල සම්පත්තියෙහි ආනුභාවයෙන් නිදුක් නිරෝගී සුවය හා චිර ජීවනය සැලසේවායි ආශිංසනය කරන අතර මෙම උදාර පුණ්‍ය ශක්තිය සමස්ත ලෝකවාසීන්ගේ සෞභාග්‍ය හා සුභසිද්ධිය උදෙසා හේතුවේවායි ප්‍රාර්ථනා කර සිටිමු.

ඒ වගන් මෙසේම,

මහනුවර උපෝෂිත පුෂ්පාරාම විහාරදිපතියාධිපති
**තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන**
මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහානිකායේ
මල්වතු මහා විහාර පාර්ශවයේ
මහානායක ස්ථවිරයන් වහන්සේ,
මල්වතු මහාවිහාරය - මහනුවර.

ගයගිරි විජයසුන්දරාරාම විහාරාධිපති
**වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතනාභිධාන**
මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහානිකායේ
අස්ගිරි මහා විහාර පාර්ශවයේ
මහානායක ස්ථවිරයන් වහන්සේ,
අස්ගිරි මහා විහාරය - මහනුවර.

**ප්‍රදීප් නිලංග දෙල,**
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාළිගාව - මහනුවර